සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Sabaragamuwa Provincial Department of Education**
சபரகமுவ மாகாணக் கல்வி திணைக்களம்

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2024
## අවසාන වාර පරීක්ෂණය

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம்
Political Science I

23 S I

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

පැය දෙකයි
02 மணித்தியாலம்
Two Hours

උපදෙස්
- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය.
- A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුය.
- එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100කි.

### A කොටස

➢ අංක 01 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

01. දේශපාලනය
(1) න්‍යාය, දර්ශනය සහ මතවාද යන කුළුණු ත්‍රිත්වය මත ගොඩනැගී තිබේ.
(2) ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයට සීමා වූ භාවිතයකි.
(3) මානවයින් සදාචාරාත්මක ඇගයුම් පද්ධතියකට හුරු කරයි.
(4) බල අරගලයේ ප්‍රායෝගික පැතිකඩ වේ.
(5) දේශපාලන විද්‍යාව හා අනන්‍යසම වේ. (..........)

02. දේශපාලන විද්‍යාව
(1) බහුවිධ න්‍යාය සහ විධික්‍රමවලින් යුක්ත වේ.
(2) ආනුභවික අධ්‍යනයන් ප්‍රතික්ෂේප කරන්නක් වේ.
(3) විද්‍යාත්මක විමර්ශනවලින් සම්පූර්ණයෙන්ම වියුක්ත වේ.
(4) දේශපාලන වේදිකාවේ දක්නට ලැබෙන ශිල්පීය ක්‍රමය වේ.
(5) දේශපාලන නායකයන් සහ පුරවැසියන් අතර සහසම්බන්ධය වේ. (..........)

03. රාජ්‍යය
(1) දෘශ්‍යමාන, පරිපූර්ණ, දුරවබෝධ සංකල්පයකි.
(2) සෑම සමාජයීය විද්‍යාවකම කේන්ද්‍රීය සාධකය වේ.
(3) ආණ්ඩුව යන්නට සමාන අර්ථ දෙන පදයකි.
(4) ස්වාධිපති බලය ක්‍රියාවට නංවන ප්‍රධානත ම ආයතනය වේ.
(5) අන්තර් ජාතික දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාධරයා වේ. (..........)

04. ස්වාධිපති බලය
(1) ප්‍රබල සහ දුබල රාජ්‍යයන් වෙන්කරනු ලබන බෙදුම් රේඛාව වේ.
(2) අසහාය, උත්තරීතර සහ සීමිත බලය වේ.
(3) කිසිවෙකුගේ අණට යටත් නොවන බලය වේ.
(4) ආණ්ඩුව සතු අධිකාරී බලය ලෙස හැඳින් වේ.
(5) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයන් තුළ වඩාත් ප්‍රබල ලෙස භාවිත කළ හැකි වේ. (..........)

05. රාජ්‍ය ප්‍රතිපත්ති
(1) නිල බල තන්ත්‍රය විසින් සකස්කර ක්‍රියාවට නංවනු ලබන ක්‍රමවේද වේ.
(2) පෞද්ගලික අරමුණු සාධනයට ආණ්ඩුවක් සකස් කර ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති වේ.
(3) දේශපාලනයෙන් සම්පූර්ණයෙන්ම වියුක්තව පවතින ක්‍රියාවලියක් වේ.
(4) ආණ්ඩුවක් විසින් කිරීමට හෝ නොකිරීමට අදහස් කරන දෑ අඩංගු සැලසුම් වේ.
(5) දේශපාලන පක්ෂවල බලපෑමෙන් සපුරා නිදහස්ව නිර්මාණය කරන්නක් වේ. (..........)

06. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
(1) සමාජ බහුවිධතාවය සහිත සමාජයන්ට වඩාත් යෝග්‍ය වේ.
(2) බලතල බෙදීමේ පදනම මත ක්‍රියාත්මක වේ.
(3) ව්‍යවස්ථාදායක විධායක නිලකාලයන් එකිනෙකට සමගාමීව අවසන් වේ.
(4) රාජ්‍යයේ ආණ්ඩුවේ නායකත්වය එක් අයෙකු සතු වේ.
(5) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරන මූලධර්ම දුර්වල වේ. (..........)

07. ජාත්‍යන්තර දේශපාලනය
(1) උණ්ඩයට වඩා ඡන්දයෙන් බලගැන්වෙන්නක් වේ.
(2) ලෝක මහා බලවතුන් අතර සිදුවන බල අරගලය වේ.
(3) විශ්වීය සදාචාර මූලධර්ම මඟින් පාලනය වේ.
(4) පූර්ණ අරාජිකභාවයකින් යුක්ත වේ.
(5)ආණ්ඩුවක් නොමැති දේශපාලනය ලෙස හැඳින් වේ. (..........)

08. සන්ධීය ආණ්ඩුක්‍රමය
(1) එක්සත්කම සහ ප්‍රාදේශීය විවිධත්වය අතර සම්මුතියක් වේ.
(2) ආණ්ඩු අතර පරිපාලන බලය සම්බන්ධීකරණයක් වේ.
(3) මධ්‍යම ආණ්ඩුව විසින් පරිධිය වෙත බලය අවධාරිත කිරීමක් වේ.
(4) මධ්‍යයේ කටයුතු පරිධිය විසින් තීරණය කරන ආණ්ඩු ක්‍රමයක් වේ.
(5) මධ්‍යම ආණ්ඩුවට පහළ මට්ටමේ පාලන ආයතන අහෝසි කළ හැකි වේ. (..........)

09. මානව අයිතිවාසිකම්
(1) රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලද අයිතිවාසිකම් වේ.
(2) ලෝකයේ වෙසෙන සෑම ජීවියෙකුටම හිමිවන අයිතිවාසිකම් වේ.
(3) මානවයන්ගේ ඉහළ මට්ටමේ නිර්මාණයක් වේ.
(4) අවවරප්‍රසාදිත තත්වයන් යටතේ අර්ථ විරහිත වේ.
(5) බැඳීම් ලෙස දේශපාලන විද්‍යා සාහිත්‍යයේ විස්තර වේ. (..........)

10. නීතියේ ආධිපත්‍ය
(1)නීතියේ පාලනය නොව මිනිසුන්ගේ පාලනය වේ.
(2) ව්‍යාවස්ථානුකූලවාදය සහ සීමිත ආණ්ඩුව සමඟ බැඳී පවතින්නක් වේ.
(3) සමාජවාදී පාලනයක් තුළ අතිශය වැදගත් වේ.
(4) ප්‍රජාතන්ත්‍රවාදය නිශේධනයට ලක් කරන්නක් වේ.
(5) නූතන ජාතික රාජ්‍ය ක්‍රමය මඟින් ව්‍යුත්පන්න වූවක් වේ. (..........)

11. දේශපාලන පක්ෂ
(1) ප්‍රතිපත්තිමය සහ මතවාදී අනන්‍යතාවයක් සහිත ආයතන විශේෂයක් වේ.
(2) ආණ්ඩුවෙන් පිටත සිට ප්‍රතිපත්ති සම්පාදනයට දායක වේ.
(3) රාජ්‍යයෙන් පරිබාහිර සමාජ අවකාශය වේ.
(4) දේශපාලන ප්‍රචණ්ඩත්වය ඇති කරනු ලබන්නක් වේ.
(5) ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යන්හි පමණක් දැකිය හැකි වේ. (..........)

12. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ ලංකාව තුළ ඇති වූ ආර්ථික හා සමාජ පරිවර්තන
(1) වාර්ගික කණ්ඩායම් අතර සමග්‍රහණයට ඉඩකඩ පුළුල් වීම.
(2) උඩරට රදළයන්ගේ ඉඩම් අයිතිය තහවුරු වීම.
(3) ස්වයංපෝෂිත ග්‍රාමීය ආර්ථික දියුණු වීම.
(4) සමාජ උපයෝගිතා සේවා වර්ධනයට පදනම වැටීම.
(5) නිදහස් ශ්‍රම වෙළඳපල ක්‍රමය බිඳ වැටීම. (..........)

13. ඇමරිකා එක්සත් ජනපද ආණ්ඩුක්‍රමය
   (1) ශේෂ බලතල පවරා ඇත්තේ මධ්‍යම ආණ්ඩුවට ය.
   (2) ප්‍රාන්ත අතර පවතින්නේ අසමතුලිත බල බෙදීමකි.
   (3) ඒකීය පරිවර්තන ක්‍රමය මගින් සන්ධීය ක්‍රමයක් ගොඩනගා ගෙන ඇත.
   (4) අන්තර් ප්‍රාන්ත වෙළදාම නියාමනය කිරීමේ බලය ප්‍රාන්ත ආණ්ඩු සතු වේ.
   (5) අධිකරණ තීන්දු වලින් මධ්‍යම ආණ්ඩුවේ බල වපසරිය පුළුල් කර තිබේ. (..........)

14. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය
   (1) පූර්ණ ස්වාධිපති බලයක් සහිත ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කර ඇත.
   (2) පූර්ව ව්‍යවස්ථා විවරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ලබා දී ඇත.
   (3) බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ හා සමුච්ඡිත මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දී ඇත.
   (4) ස්වෛරී, ස්වාධීන රාජ්‍යයක් බවට ලංකාව පත්කර ඇත.
   (5) බහුතර නියෝජන ක්‍රමය වෙනුවට සමානුපාතික ක්‍රමය හඳුන්වා දී ඇත. (..........)

15. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය
   (1) රාජ්‍ය සේවය නිර්දේශපාලනීකරණය කරනු ලැබීය.
   (2) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ඉලක්ක කරගත් ප්‍රතිපත්ති මූලධර්මයක් හඳුන්වා දුණි.
   (3) අර්ධ ජනාධිපති ආකෘතිය පදනම් කරගනු ලැබීය.
   (4) පරිපූර්ණ මූලික අයිතිවාසිකම් ප්‍රකාශනයක් ප්‍රථම වරට හඳුන්වා දෙනු ලැබීය.
   (5) අධිකරණ සේවා කොමිසම යළි බල ගැන්වුණි. (..........)

16. ආණ්ඩුව
   (1) ස්වාධිපති බලයේ තනි උරුමකරුවා වේ.
   (2) රාජ්‍යයට පූර්වයෙන් ආරම්භ වූවක් වේ.
   (3) සියලු පුරවැසියන්ගේ සාමාජිකත්වයෙන් යුක්ත වේ.
   (4) ඒකීය, නිශ්චිත ස්වරූපයකින් සමන්විත වේ.
   51) රාජ්‍යයේ පොදු ආශාවන් ක්‍රියාවට පරිවර්තනය කරන්නා වේ. (..........)

17. සමාජවාදී දේශපාලන මතවාදය
   (1) ධනවාදී ක්‍රමය නවීකරණය කිරීමට අපේක්ෂා කරයි.
   (2) විප්ලවීය පරිවර්තනයකින් බලය ලබා ගැනීම ප්‍රතික්ෂේප කරයි.
   (3) පන්ති සහිත සමාජ ක්‍රමයක පැවැත්ම තහවුරු කරයි.
   (4) දිළිදු ජන කොටස් වලට සහන දීමට රාජ්‍යයේ අනාගත පැවැත්ම අපේක්ෂා කරයි.
   (5) මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථික කටයුතු නියාමනය කරයි. (..........)

18. ගැටුම්
   (1)සෑම අවස්ථාවකම නිශේධනීය ප්‍රතිඵල ඇති කරන්නක් වේ.
   (2) තරඟකාරීත්ව, අනන්‍යතා නිර්මාපකවල වෙනස්කම් සහ සමානාත්මතාව මත ඇති වේ.
   (3) මානව සමාජ ක්‍රියාකාරීත්වයේ කෘත්‍රිම ප්‍රතිඵලයක්වේ.
   (4) පුළුල් බහු විෂයික අධ්‍යන ධාරාවක් වේ.
   (5) සමථනය කිරීම සරල සාමාන්‍ය ක්‍රියාවලියක් වේ. (..........)

19. සිවිල් සමාජය
   (1) රාජ්‍ය, පවුල සහ වෙළඳපල යන ආයතන සමඟ සමීපව බැඳී පවතී.
   (2) සක්‍රීය ප්‍රජාතන්ත්‍රවාදයේ දොරටු වසා දැමීමට ලක් කරයි.
   (3) ක්‍රමානුකූල සහ සංවිධානාත්මක ව්‍යුහයක් සහ සාමාජිකත්වයක් සහිත සංවිධාන වේ.
   (4) ප්‍රජාතන්ත්‍රවාදී සහ ප්‍රජාතන්ත්‍රවාදී නොවන සමාජවල පුළුල් දේශපාලන අභිලාෂ මතුකරයි.
   (5) පොදු සහ පෞද්ගලික අරමුණු සාධනය කිරීමට දායක වේ. (..........)

20. නිරාගමිකවාදය
   (1) 16 වන සියවසේ යුරෝපයේ ඇති වූ ප්‍රබුද්ධවාදී චින්තනයේ ම කොටසක් වේ.
   (2) රාජ්‍යය හා පල්ලිය අතර සම්බන්ධය නිසා ඇතිවූ අශුද්ධ සන්ධානයට එරෙහිව මතුවීමක්වේ.
   (3) පල්ලිය පවත්වාගෙන ගිය බුද්ධිමය ආධිපත්‍ය සාධාරණීකරණය කිරීමක් වේ.
   (4) දේවවරම්වාදය හා සමාන්තරව වර්ධනය වූ දෘෂ්ටිවාදයක් වේ.
   (5) ආගමික මූලධර්මවාදී රාජ්‍යයක් බිහිවීම සාධාරණීකරණය කරන්නක් වේ. (..........)

➢ අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

21. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ නව ප්‍රවණතා
  A - ඉන්දියාව කේන්ද්‍රකරගත් විදේශ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යනු ලබයි.
  B - ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඉහළ මට්ටමකින් පවත්වාගෙන යනු ලබයි.
  C - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිසංස්කරණ මත ක්‍රියාත්මක වේ.
  D - දකුණු ආසියානු කලාපය තුළ ශ්‍රී ලංකාව හුදකලා රාජ්‍යයක් බවට පත්ව තිබේ.
  E - ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ නිර්දේශයන් අනුකූලව කටයුතු කරනු ලබයි.

  1. ABCD 2. ABCE 3. ABDE 4. ACDE 5. BCDE (..........)

22. ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය
  A - උතුරු - නැගෙනහිර ප්‍රදේශවල ජනවාර්ගික අර්බුදයට විසඳුම් ලෙස හඳුන්වා දී ඇත.
  B - ඉන්දියානු බලය බෙදීමේ ක්‍රමය හා සමාන ක්‍රමයක් වේ.
  C - ඉන්දු - ලංකා ගිවිසුමේ ඍජු ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගුවක් වේ.
  D - දේශපාලන බලය විමධ්‍යගතකරණ ආකෘතියක් වේ.
  E - ඒකීය පරිවර්තන රාජ්‍ය ක්‍රමයක් කරා ගමන් කිරීමක් වේ.

  1. ABCD 2. ABCE 3. ABDE 4. ACDE 5. BCDE (..........)

23. ප්‍රංශ ආණ්ඩුක්‍රමය
  A - දේශපාලන බලය විමධ්‍යගතකරණයට ලක්කර ඇත.
  B - ජනාධිපති ධූරය වටා බලය සංකේන්ද්‍රගත කර ඇත.
  C - උප ජාතික ආණ්ඩු තල තුනක් යටතේ ජරිපාලන බලය විමධ්‍යගත කර ඇත.
  D - ප්‍රාදේශීය පලාත් පාලන ඒකක නිළධාරීවාදයකට ලක්ව ඇතැයි විවේචන ඉදිරිපත්ව ඇත.
  E - උපජාතික ආණ්ඩු පිළිබඳ තීරණ ගැනීමට ආයතන වර්ග හතරක් ක්‍රියාත්මකව ඇත.

  1. ABCD 2. ABCE 3. ABDE 4. ACDE 5. BCDE (..........)

24. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය
  A - සීමිත රාජ්‍ය සංකල්පය අවධාරණය කරයි.
  B - ඒකාධිපති රාජ්‍යවාදයට එරෙහිව මානව නිදහස තහවුරු කරයි.
  C - ධනවාදී ආර්ථික ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය එකිනෙකට සම්බන්ධ කරයි.
  D - සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය වර්ධනය කරයි.
  E - රාජ්‍යය මූලික කරගත් ආර්ථික ක්‍රමයක් අනුගමනය කරයි.

  1. ABCD 2. ABCE 3. ABDE 4. ACDE 5. BCDE (..........)

25. ස්ත්‍රීවාදී න්‍යාය
  A - ලිබරල්වාදය සහ මාක්ස්වාදය අතර දෝලනය වන්නක් වේ.
  B - දේශපාලනය පෞද්ගලික පරිමණ්ඩලයේ ක්‍රියාවලියක් ලෙස සැලකේ.
  C - රාජ්‍ය පිළිබඳ විශේෂ න්‍යායක් ලෙස සැලකේ.
  D - දේශපාලන හා සමාජ විග්‍රහයට නව සංකල්ප එකතු කර තිබේ.
  E - නව දේශපාලන න්‍යායක් ලෙස දේශපාලන විද්‍යාව පෝෂණය කර තිබේ.

  1. ABCD 2. ABCE 3. ABDE 4.ACDE 5. BCDE (..........)

➢ අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැලපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1) (2) (3) (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉරමත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 26 | 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව තුළ ඡන්ද විමසීම් වලදී කථානායකවරයා සාමාන්‍ය ඡන්දය භාවිතා කිරීමක් සිදු නොකරයි. | පාර්ලිමේන්තුව තුළ ඡන්ද සම වූ අවස්ථාවකදී කථානායක වරයාට තීරක ඡන්දය භාවිතා කිරීමේ බලය හිමිවේ. | (..........) |
| 27 | 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රමයේ ජනාධිපතිධූරය පුරප්පාඩු වූ අවස්ථාවකදී අගමැතිවරයා වැඩබලන ජනාධිපතිවරයා ලෙස පත්වේ. | වැඩබලන ජනාධිපති පත්වී මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුව තුළින් අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙක් පුරප්පාඩු වූ ජනාධිපතිවරයාගේ ඉතිරි ධූර කාලය සඳහා පත්කරගනී. | (..........) |
| 28 | 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 126 වගන්තියට අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූවෙකු මාසයක් ඇතුළත අභියාචනාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ යුතුය. | 1978 ආණ්ඩුක්‍රමයේ මූලික අයිතිවාසිකම් ප්‍රකාශනය 1972 ආණ්ඩුක්‍රමයේ මූලික අයිතිවාසිකම් ප්‍රකාශනයට වඩා පරිපූර්ණ හා අර්ථාන්විත ප්‍රකාශනයක් වේ. | (..........) |
| 29 | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරනු ලැබූ 17 වන සංශෝධනය මඟින් තනතුරුවලට පත් කිරීමේ ජනාධිපතිවරයා සතු අභිමතානුසාරී බලය සංවරණය කර තිබේ. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරනු ලැබූ 18 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් ජනාධිපතිවරයා මාස 3 කට වරක් පාර්ලිමේන්තුවට පැමිණීම අවශ්‍ය බව දක්වා ඇත. | (..........) |
| 30 | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 19 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් පාර්ලිමේන්තුව ප්‍රතික්ෂේප කළ පනත් කෙටුම්පතක් ජනමත විචාරණයකට ලක් කිරීමට ජනාධිපතිවරයාට බලය ලබා දී ඇත. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 20 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් පාර්ලිමේන්තු සභාවට සිවිල් සමාජ ක්‍රියාකාරීන් තිදෙනෙක් ඇතුළත් කිරීමට ඉඩ ලබා දී ඇත. | (..........) |

## B කොටස

31. දාර්ශනික (ප්‍රතිමානීය) ප්‍රවේශයේ මූලික ලක්ෂණ 3ක් පවතී. ඉන් දෙකක් නම් කරන්න.

1. ................................................................................................................................................

2. ...............................................................................................................................................

32. යුක්තිය පිළිබඳ න්‍යාය සහ මහජන පරිමණ්ඩල න්‍යාය ඉදිරිපත් කළ න්‍යායවේදීන් දෙදෙනා පිළිවෙළින් ඉදිරිපත් කරන්න.

1. ................................................................................................................................................

2. ...............................................................................................................................................

33. ඇමරිකා එක්සත් ජනපදය තුළ බලපෑම් කණ්ඩායම් වර්ග දෙකක් ක්‍රියාත්මක වේ. ඒ මොනවාද?

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

34. සිවිල් ජීවිතය සහ සමාජ පුරවැසිභාවය යන සංකල්ප ඉදිරිපත් කළ දේශපාලන චින්තකයින් දෙදෙනා පිළිවෙළින් දක්වන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

35. නූතන ජාතික රාජ්‍යයන්හි ස්වාධිපති බලයට අභියෝග කරන ක්‍රියාවලි දෙකක් නම් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

36. ලිබරල්වාදය තුළ ප්‍රධාන ඇඟවීම් දෙකක් විස්තර කරයි. එම ඇඟවීම් දෙක දක්වන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

37. ඒකතන්ත්‍රවාදයේ ප්‍රධාන ඓතිහාසික ස්වරූප දෙක නම් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

38. 20 සියවසේ සමූහාණ්ඩුවාදී සම්ප්‍රදායේ ප්‍රධාන චින්තකයන් මතු කළ අදහස්වල ප්‍රධාන තේමා දෙකකි ඒවා නම් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

39. ගැටුම් සමථනය සම්බන්ධ ප්‍රවේශ ගණනාවක් ඉදිරිපත්ව තිබේ. ඉන් දෙකක් නම් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

40. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ ලංකාවේ ද්විත්ව ආර්ථිකයක් ගොඩනැගී තිබුණි. ඒවා නම් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

41. 1946 ප්‍රථම සීමා නිර්ණය කොමිසම විසින් පිහිටවූ බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස දෙකක් නම් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

42. ඒකීය රාජ්‍යයන්හි පරිවර්තන මාදිලි දක්නට ලැබෙන රාජ්‍යයන් 2ක් නම් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

43. ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමයෙහි ආණ්ඩු මට්ටම් තුනක් පවතී. ඉන් දෙකක් නම් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

44. විවිධ සමාජ ක්‍රමවල පවතින අධිකාරී ක්‍රම තුනක් ජර්මන් ජාතික මැක්ස් වෙබර් දක්වා තිබේ. ඉන් දෙකක් නම් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

45. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රමයේ අධිකරණ සේවය සම්බන්ධයෙන් ඇතිකළ විශේෂික ආයතන දෙක නම් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

46. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය මගින් ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කිරීමට ඇතිකර තිබූ මාර්ග දෙක නම් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

47. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය මගින් ඇතිකළ නව කොමිසන් සභා දෙක නම් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

48. ශ්‍රී ලංකාව සම්බන්ධතා දක්වන දකුණු ආසියානු කලාපයට අයත් ජාත්‍යන්තර රාජ්‍ය සංවිධාන දෙකක් නම් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

49. රාජ්‍යයක් ජාතික බලය ක්‍රියාවට නැංවීම සඳහා භාවිතයට ගනු ලබන උපාය මාර්ග කිහිපයකි. ඉන් දෙකක් නම් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

50. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නව වාමාංශික දේශපාලන පක්ෂ 2ක් නම් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவ மாகாணக் கல்வி திணைக்களம்

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2024
## අවසාන වාර පරීක්ෂණය

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம்
Political Science II

23 | S | II

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

පැය තුනයි
03 மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதி வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න

උපදෙස් :

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය.
* I කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, III කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

### I කොටස

1. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා භාවිතා කරන දාර්ශනික (ප්‍රතිමානීය) ප්‍රවේශය හඳුන්වා එහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 20)
2. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් විස්තර කරන්න.
   (i) ගෝලීයකරණය හා රාජ්‍ය
   (ii) රාජ්‍ය හා පුරවැසියා
   (iii) රාජ්‍ය හා ස්වාධිපත්‍ය (ලකුණු 10×2 = 20)
3. ඒකීය ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණවලින් සන්ධීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ වෙනස් වන්නේ කෙසේදැයි විශ්ලේෂණය කරන්න.
   (ලකුණු 20)

### II කොටස

4. (i) 1833 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ මගින් ලංකාවේ ඇති වූ සමාජ, ආර්ථික ප්‍රතිඵල විස්තර කරන්න. (ලකුණු 10)
   (ii) ''1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය ලංකා දේශපාලන ඉතිහාසයේ සන්ධිස්ථානයක් විය'' පැහැදිලි කරන්න. (ලකුණු 10)

5. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ සහ 1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමයේ රාජ්‍ය සේවයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 10)

6. 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රමයේ පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් විස්තර කරන්න.

(i) ජනාධිපතිවරයා තෝරා පත් කරගන්නා ආකාරය

(ii) ජනාධිපතිවරයා හා කැබිනට් මණ්ඩලය අතර සම්බන්ධය

(iii) ජනාධිපතිවරයා හා රාජ්‍ය සේවය අතර සම්බන්ධය

(iv) අධිකරණයේ ස්වාධීනත්වය සහ භාවිතය (ලකුණු 10×2 = 20)

7. 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට කරන ලද පහත සංශෝධන මගින් ගනු ලැබූ ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(i) 13 වන ව්‍යවස්ථා සංශෝධනය (ලකුණු 10)

(ii) 19 වන ව්‍යවස්ථා සංශෝධනය (ලකුණු 10)

## III කොටස

8. (i) ඇමරිකා එක්සත් ජනපද ආණ්ඩු ක්‍රමයේ දක්නට ලැබෙන සාමාන්‍ය ලක්ෂණ හඳුන්වන්න. (ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාවේ ඒකීය ආණ්ඩුක්‍රම මාදිලිය පරිවර්තනයන්ට ලක්වී ඇති ආකාරය විග්‍රහ කරන්න. (ලකුණු 10)

9. ජාත්‍යන්තර දේශපාලනයේ නව ප්‍රවණතා පැහැදිලි කරන්න. (ලකුණු 20)

10. පහත මාතෘකා අතුරින් දෙකක් පිලිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ගැටුම් ජීවන චක්‍රය

(ii) රාජ්‍ය ප්‍රතිපත්ති හා නිලබල ක්‍රමය

(iii) බලතල බෙදීමේ න්‍යාය සහ භාවිතය

(iv) ස්ත්‍රීවාදී මතවාදය

(v) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ නව ප්‍රවණතා

(vi) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ නව ප්‍රවණතා (ලකුණු 10×2 = 20)

## පිළිතුරු පත්‍රය - දේශපාලන විද්‍යාව
## 13 ශ්‍රේණිය - 2024

| | | |
|---|---|---|
| 1 - 4 | 11 - 1 | 21 - 2 |
| 2 - 1 | 12 - 4 | 22 - 4 |
| 3 - 5 | 13 - 5 | 23 - 5 |
| 4 - 3 | 14 - 3 | 24 - 1 |
| 5 - 4 | 15 - 2 | 25 - 3 |
| 6 - 3 | 16 - 5 | 26 - 5 |
| 7 - 5 | 17 - 5 | 27 - 2 |
| 8 - 1 | 18 - 4 | 28 - 3 |
| 9 - 4 | 19 - 4 | 29 - 1 |
| 10 - 2 | 20 - 2 | 30 - 4 |

31. ★ ලෝකය පිළිබඳ අති මූලික ප්‍රශ්න ඇසීම හා විභාග කිරීම.

★ දර්ශනවාදීහු ලෝකය තේරුම් කර ලැනීමට භාවිතා කරන සංකල්පවල අර්ථය නිරවුල් කර ගැනීම.

★ දේශපාලන සංකල්ප වල ප්‍රතිමානිය අදහස් දැක්වීම.

32. (1) ජෝන් රෝල්ස්

(2) යර්ගන් හබර්මාස්

33. (1) අභිලාෂ කණ්ඩායම්/ ආශා කණ්ඩායම්

(2) ලොබි කණ්ඩායම්

34. (1) ඇලෙක්සිද තොක්විල්

(2) T.H. මාෂල්

35. (1) සන්ධීවාදය

(2) ගෝලීයකරණය

36. (1) දාර්ශනික ඇඟවීම

(2) දේශපාලනික ඇඟවීම

37. (1) පරම රාජාණ්ඩු ක්‍රම

(2) ඒකාධිපතිවාදය

38. (1) දේශපාලන ආධිපත්‍යයෙන් තොරව සාක්ෂාත් කරනු ලබන නිදහස.

(2) නිදහස සාක්ෂාත් කර ගැනීම සඳහා පුරවැසි ක්‍රියාකාරීත්වය.

39. (1) අනන්‍යතා අවශ්‍යතා ප්‍රවේශය.

(2) මානව අවශ්‍යතා ප්‍රවේශය. ප්‍රජා සම්බන්ධතා ප්‍රවේශය.

සංස්කෘතික සන්නිවේදන ප්‍රවේශය. ගැටලු විසඳීමේ ප්‍රවේශය.

ගැටුම් පරිවර්තන ප්‍රවේශය.

40. (1) සාම්ප්‍රදායික යැපුම් කෘෂිකාර්මික ආර්ථිකය.

(2) වානිජ/ ධනේෂ්වර ආර්ථිකය.(වැවිලි ආර්ථිකය)

41. (1) බදුල්ල

(2) බලංගොඩ

කඩුගන්නාව

අම්බලංගොඩ - බලපිටිය

මැද කොළඹ

42. (1) බ්‍රිතාන්‍ය

(2) ශ්‍රී ලංකාව

43. (1) මධ්‍යම ආණ්ඩුව

(2) කැන්ටන

කොමියුන

44. (1) සාම්ප්‍රදායික අධිකාරිය

(2) අනුහස් හෙවත් කැරිස්මා අධිකාරිය

★ නෛතික හෙවත් තාර්කික අධිකාරිය

45. (1) අධිකරණ සේවා උපදේශක මණ්ඩලය

(2) අධිකරණ සේවා විනය මණ්ඩලය

46. (1) පාර්ලිමේන්තුව මඟින්

(2) ජනමත විචාරණ ක්‍රමය මඟින්

47. (1) ජාතික විගණන සේවා කොමිෂම

(2) ජාතික ප්‍රසම්පාදන කොමිෂම

48. (1) දකුණු ආසියානු සහයෝගිතා සංවිධානය/ SAARC

(2) බිම්ස්ටෙස් සංවිධානය

49. (1) විදේශ ප්‍රතිපත්තිය/රාජතාන්ත්‍රික සබඳතා

(2) ප්‍රචාරණය

ආර්ථික උපාය මාර්ග

යුධමය තත්ත්වය.

විනිවිද යාම හා මැදිහත්වීම්.

සන්ධාන හා ගිවිසුම්ගතවීම.

50 (1) විප්ලවකාරී සම සමාජ පක්ෂය.

කොමියුනිස්ට් පක්ෂයේ චීන පිල.

නව සම සමාජ පක්ෂය.

ජනතා විමුක්ති පෙරමුණ.

පෙරටුගාමී සමාජවාදී පක්ෂය.

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

(12) WWW.PastPapers.WiKi (12)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!